(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 106.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2024 ජනවාරි 24 බදාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය සහ වාරිමාර්ග අමාත්‍යතුමිය

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **ගෝවින්දන් කරුණාකරම් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **නීතිඥ සාගර කාරියවසම් මහතා**

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු නයන වාසලතිලක මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානි සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/4/5/1

2024 ජනවාරි මස 23 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 'ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් පහක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි."

II

"2024 ජනවාරි 23 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් හයට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව 'ත්‍රස්ත විරෝධී' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් දහඅටක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

III

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් 2024 ජනවාරි 23 දින 'වංචා වැළැක්වීමේ (සංශෝධන)', 'සමථ මණ්ඩල (සංශෝධන)', 'ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන)' සහ 'ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය' නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

3. **ලිපිලේඛනාදිය පිළිගැන්වීම**: (1) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ VII කොටස සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජුනි 28 දිනැති අංක 2338/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24අ වගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ඔක්තෝබර් 05 දිනැති අංක 2352/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග

ඉදිරිපත් කර එම නියෝග ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම**: (1) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු චමල් රාජපක්ෂ මහතා විසින් නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) බැංකුකරණය හා මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු ගාමිණී ලොකුගේ මහතා විසින් නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා බැංකුකරණය හා මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) නාකුළුගමුව, මහවෙල, 'රංග', යන ලිපිනයෙහි පදිංචි ජී.පී.එච්. නිහාල් නන්දසිරි මහතාගෙන් ලැබුණු 2023.10.18 දිනැති පෙත්සම; සහ

(ii) ඌරගස්මංහන්දිය, මැන්ඩෝරාවල, 'ශ්‍රීයාණි', යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. පියදාස මහතාගෙන් ලැබුණු 2023.10.09 දිනැති පෙත්සම

ගරු වජිර අබේවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) වාරියපොල, හොරොම්බුව, ගලබඩවත්ත, යන ලිපිනයෙහි පදිංචි ජේ.එම්. දයාරත්න මහතාගෙන් ලැබුණු 2023.09.26 දිනැති පෙත්සම ගරු ජයරත්න හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) මාතර, හිත්තැටිය මැද, හේවගේ වත්ත, අංක 106 ඒ, දරන ස්ථානයෙහි පදිංචි අනුර වීරසිංහ මහතාගෙන් ලැබුණු 2023.02.06 දිනැති පෙත්සම; සහ

(ii) නාවල, පරණ පාර, අංක 78/2, දරන ස්ථානයෙහි පදිංචි සුමනා ජයතිලක මහත්මියගෙන් ලැබුණු 2023.10.16 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. බේදුම් නඩු (සංශෝධන):** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළි ගැන්වූ පනත් කෙටුම්පත,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බේදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 පෙබරවාරි 07 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා සහ අ.භා. 1.00 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 (5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 5 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. වරප්‍රසාද:** ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2023 නොවැම්බර් 07 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2024 පෙබරවාරි 06 අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත**: කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. (ඊට අදාළ ප්‍රශ්නය 2024 ජනවාරි 23)

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි යන ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(අ.භා. 12.06 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 12.57 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.01ට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

"ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.25ට ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.03ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි මහජන ආරක්ෂක අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.36ට ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.59 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 108; විරුද්ධව 62; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය හැත්තෑදෙනෙක් (170) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Pavithradevi Wanniarachchi | Yes |
| G 002. Nimal Siripala De Silva | Yes |
| G 003. Chamal Rajapaksa | Yes |
| G 004. Mahinda Rajapaksa | Yes |
| G 005. Prasanna Ranatunga | Yes |
| G 006. Susil Premajayantha | Yes |
| G 007. Dinesh Gunawardena | Yes |
| G 009. Douglas Devananda | Yes |
| G 010. Bandula Gunawardana | Yes |
| G 011. Keheliya Rambukwella | Yes |
| G 012. Mahinda Amaraweera | Yes |
| G 013. Wijeyadasa Rajapakshe | Yes |
| G 015. Ramesh Pathirana | Yes |
| G 017. Vidura Wickramanayaka | Yes |
| G 018. Kanchana Wijesekera | Yes |
| G 019. Manusha Nanayakkara | Yes |
| G 020. Tiran Alles | Yes |
| G 021. Ajith Rajapakse | Yes |
| G 022. Nalin Fernando | Yes |
| G 024. Ranjith Siyambalapitiya | Yes |
| G 025. Jagath Pushpakumara | Yes |

| | |
|---|---|
| G 026. Dilum Amunugama | Yes |
| G 027. Mohan Priyadarshana De Silva | Yes |
| G 028. Janaka Wakkumbura | Yes |
| G 029. Shehan Semasinghe | Yes |
| G 030. Kanaka Herath | Yes |
| G 031. Thenuka Vidanagamage | Yes |
| G 032. Pramitha Bandara Tennakoon | Yes |
| G 033. Lasantha Alagiyawanna | Yes |
| G 034. Rohana Dissanayaka | Yes |
| G 037. Vijitha Berugoda | Yes |
| G 038. Lohan Ratwaththe | Yes |
| G 039. Sanath Nishantha | Yes |
| G 040. Tharaka Balasuriya | Yes |
| G 041. Indika Anuruddha Herath | Yes |
| G 042. Siripala Gamalath | Yes |
| G 043. Anuradha Jayaratne | Yes |
| G 044. S. Viyalanderan | Yes |
| G 045. D.V. Chanaka | Yes |
| G 046. Sisira Jayakody | Yes |
| G 047. Piyal Nishantha De Silva | Yes |
| G 048. Prasanna Ranaweera | Yes |
| G 049. D. B. Herath | Yes |
| G 050. Shasheendra Rajapaksa | Yes |
| G 051. Seetha Arambepola | Yes |
| G 052. Shantha Bandara | Yes |
| G 055. A. Aravindh Kumar | Yes |
| G 056. Geetha Samanmale Kumarasinghe | Yes |
| G 057. Suren Raghavan | Yes |
| G 058. Diana Gamage | Yes |
| G 059. Sivanesathurai Santhirakanthan | Yes |
| G 060. Chamara Sampath Dasanayake | Yes |
| G 061. Anupa Pasqual | Yes |
| G 063. S. B. Dissanayake | Yes |
| G 064. Gamini Lokuge | Yes |
| G 065. Vajira Abeywardena | Yes |
| G 066. Janaka Bandara Tennakoon | Yes |

| | |
|---|---|
| G 067. C. B. Rathnayake | Yes |
| G 068. S. M. Chandrasena | Yes |
| G 069. Mahindananda Aluthgamage | Yes |
| G 071. Namal Rajapaksa | Yes |
| G 072. Sarath Weerasekara | Yes |
| G 073. Wimalaweera Dissanayaka | Yes |
| G 074. Roshan Ranasinghe | No |
| G 076. Kapila Athukorala | Yes |
| G 077. Gayashan Nawananda | Yes |
| G 079. Jayantha Ketagoda | Yes |
| G 080. Sampath Athukorala | Yes |
| G 082. U. K. Sumith Udukumbura | Yes |
| G 083. Pradeep Undugoda | Yes |
| G 084. Sanjeeva Edirimanna | Yes |
| G 085. Akila Ellawala | Yes |
| G 086. Jagath Kumara Sumithraarachchi | Yes |
| G 087. Karunadasa Kodithuwakku | Yes |
| G 088. Nalaka Bandara Kottegoda | Yes |
| G 089. Udayakantha Gunathilaka | Yes |
| G 090. Kokila Gunawardene | Yes |
| G 091. Milan Jayathilake | Yes |
| G 092. Kulasingam Dhileeban | Yes |
| G 093. Sudarshana Denipitiya | Yes |
| G 094. Isuru Dodangoda | Yes |
| G 095. Premnath C. Dolawatte | Yes |
| G 096. H. Nandasena | Yes |
| G 097. Muditha Prishanthi | Yes |
| G 098. Sudath Manjula | Yes |
| G 099. Mayadunna Chinthaka Amal | Yes |
| G 100. Nipuna Ranawaka | Yes |
| G 101. Kumarasiri Rathnayaka | Yes |
| G 102. Gunathilaka Rajapaksha | Yes |
| G 103. Upul Mahendra Rajapaksha | Yes |
| G 105. Rajika Wickramasinghe | Yes |
| G 106. M. W. D. Sahan Pradeep Withana | Yes |
| G 107. Madhura Withanage | Yes |

| | |
|---|---|
| G 108. D. Weerasingha | Yes |
| G 109. Samanpriya Herath | Yes |
| G 110. Sagara Kariyawasam | Yes |
| G 111. Yadamini Gunawardena | Yes |
| G 112. Manjula Dissanayake | Yes |
| G 113. Ranjith Bandara | Yes |
| G 114. Jayantha Weerasinghe | Yes |
| G 115. Marjan Faleel | Yes |
| G 116. Lalith Varna Kumara | Yes |
| O 001. Rishad Bathiudeen | No |
| O 002. Rajitha Senarathne | No |
| O 003. Imthiaz Bakeer Markar | No |
| O 004. Tissa Attanayake | No |
| O 005. Rauff Hakeem | No |
| O 006. Gayantha Karunatilleka | No |
| O 007. Lakshman Kiriella | No |
| O 008. Sajith Premadasa | No |
| O 009. Kumara Welgama | No |
| O 010. Patali Champika Ranawaka | No |
| O 012. Mano Ganesan | No |
| O 013. Maithreepala Sirisena | No |
| O 015. G.L. Peiris | No |
| O 016. Anura Dissanayaka | No |
| O 017. A. L. M. Athaullah | Yes |
| O 018. G. G. Ponnambalam | No |
| O 022. Kabir Hashim | No |
| O 024. Abdul Haleem | No |
| O 026. Harsha De Silva | No |
| O 029. Dilip Wedaarachchi | No |
| O 030. Niroshan Perera | No |
| O 031. Eran Wickramaratne | No |
| O 032. J. C. Alawathuwala | No |
| O 033. John Seneviratne | Yes |
| O 036. Dullas Alahapperuma | No |
| O 037. Vijitha Herath | No |
| O 040. Ali Sabri Raheem | Yes |

| | |
|---|---|
| O 042. Vadivel Suresh | Yes |
| O 043. Faizal Cassim | No |
| O 046. Ali Zahir Moulana Seyad | No |
| O 047. Ajith Mannapperuma | No |
| O 048. Buddhika Pathirana | No |
| O 049. M. S. Thowfeek | No |
| O 050. Nalin Bandara Jayamaha | No |
| O 051. Hector Appuhamy | No |
| O 052. Thushara Indunil Amarasena | No |
| O 053. Dilan Perera | No |
| O 056. Vasudeva Nanayakkara | No |
| O 057. Harini Amarasuriya | No |
| O 058. Govindan Karunakaram | No |
| O 062. Kavinda Heshan Jayawardhana | No |
| O 064. K. Sujith Sanjaya Perera | No |
| O 065. S. M. Marikkar | No |
| O 066. Imran Maharoof | No |
| O 068. Harshana Rajakaruna | No |
| O 069. Rohini Kumari Wijerathna | No |
| O 072. M. Udayakumar | No |
| O 074. Duminda Dissanayake | Yes |
| O 075. Chandima Weerakkody | No |
| O 076. Dayasiri Jayasekara | No |
| O 077. Sivagnanam Shritharan | No |
| O 078. M. A. Sumanthiran | No |
| O 079. Charles Nirmalanathan | No |
| O 080. S. Rajaputhiran Rasamanickam | No |
| O 081. W. H. M. Dharmasena | No |
| O 082. Kins Nelson | No |
| O 083. Rohana Bandara | No |
| O 089. Nimal Lanza | Yes |
| O 090. Jayantha Samaraweera | No |
| O 091. B. Y. G. Rathnasekara | No |
| O 092. Sarathie Dushmantha | No |
| O 095. Udayana Kirindigoda | No |
| O 101. S. Jagath Samarawickrama | Yes |

O 107. Wasantha Yapabandara No

O 110. Weerasumana Weerasinghe No

O 112. Charitha Herath No

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දෙදෙනෙකුගේ (02) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

Field Marshal Sarath Fonseka No

V. Radhakrishnan No

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 11 වැනි සහ 12 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"හෝ ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තකුට අලාභයක්, හානියක් හෝ පීඩාවක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිදු".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"3. මේ පනතේ අරමුණු -

(අ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා තහනම් ප්‍රකාශ සන්නිවේදනය කිරීම මගින් ඇතිවන පීඩාවකින් තැනැත්තන් ආරක්ෂා කිරීම;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 5 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ආ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා අධිකරණයට අපහාස වන්නා වූ හෝ අධිකරණයේ බලය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා ශ්‍රී ලංකාව තුළ තහනම් ප්‍රකාශ නැවත".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 2 වැනි පේළියේ සිට 16 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) මාර්ගගත ගිණුමක් මඟින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා තහනම් ප්‍රකාශ සන්නිවේදනය කිරීමෙන් සිදුවන හානියෙන් පුද්ගලයන් ආරක්ෂා කිරීම;

(ආ) මාර්ගගත ගිණුමක් මඟින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා අධිකරණයට අපහාස වන්නාවූ හෝ අධිකරණයේ බලය සහ අපක්ෂපාතිත්වය පවත්වාගෙන යාමට අගතිගාමී වන්නාවූ ප්‍රකාශ සන්නිවේදනය කිරීමෙන් ආරක්ෂා වීම තහවුරු කිරීම;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තිය සභා සම්මත විය.

5 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවෙන් පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම

**5.** (1) තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා, පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍ර එකක හෝ වැඩි ගණනක සුදුසුකම් සහ පළපුරුද්ද සහිත තැනැත්තන් අතරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස්දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතු ය.

(2) 6 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු තැනැත්තන් පස්දෙනෙකුගේ නම් අනුමතය සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නිර්දේශ කළ යුතුය.

(3) ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ලැබීමෙන් දින දහහතරක කාලසීමාවක් ඇතුළත, (2) වන උපවගන්තිය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුගේ නම අනුමත කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් අලුත් නාමයෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ අනුව එම නාමයෝජනාව සඳහා (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි දින දහහතරක කාලසීමාවක් ඇතුළත අවශ්‍ය පත් කිරීම් සිදු කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වන අවස්ථාවක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන්, ඒ කාලසීමාව ඉකුත් වන දින සිට බලපවත්වන පරිදි, කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නම්කරන ලදුව ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන, තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා, පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍ර එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත, සාමාජිකයන් පස්දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතුය.

(2) 6 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කිරීම් සිදුකරනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් (1) උප වගන්තිය යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කරනු පිණිස පුද්ගලයන් පස් දෙනෙකුගේ නම් යෝජනා කළ යුතුය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නාම යෝජනා ලැබීමෙන් දින දහ හතරක කාලයක් ඇතුළත ජනාධිපතිවරයා විසින් (2) උප වගන්තිය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

සභාව විසින් නම්කරන ලද පුද්ගලයන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතුය.

(4) (3) උප වගන්තිය තුළ දක්වා ඇති දින දහහතරක කාල පරිච්ඡේදය ඇතුළත අවශ්‍ය පත්කිරීම් සිදුකිරීමට ජනාධිපතිවරයා අසමත් වුවහොත්, එම කාල පරිච්ඡේදය ඉක්ම ගිය දින සිට ක්‍රියාත්මකවන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නම්කරන ලද පුද්ගලයන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කරනු ලැබ ඇත්තා සේ සැලකිය යුතුය.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තිය සභා සම්මත විය.

7 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 19 වැනි සහ 20 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු -

(අ) මාස තුනකට වැඩි කාලසීමාවක් තිස්සේ පවත්නා ශාරීරික හෝ මානසික දුබලතාවක් හේතුවෙන් සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට නොහැකි වන;

(ආ) කොමිෂන් සභාවේ අනුමතය නොමැතිව අඛණ්ඩව මාස තුනකට වැඩි කාලසීමාවක් සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම පැහැර හැර ඇති; හෝ

(ඇ) 6 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර නුසුදුස්සකු වී ඇති,

අවස්ථාවක අදාළ සාමාජිකයාට කරුණු කියාපෑමට අවස්ථාවක් දීමෙන් පසුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් ඒ තැනැත්තා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන යම් කරුණු විභාග කිරීමක්, එම කරුණු විභාග කිරීම ආරම්භ වන දිනෙන් මාස තුනක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ලැබීමෙන් පසුව, ජනාධිපතිවරයා විසින් ලියවිල්ලක් මඟින් ඒ කොමිෂන් සභාවේ සාමාජිකයා ඉවත් කරනු ලැබිය යුතු අතර, ඒ ඉවත් කිරීමේ ලිපියෙහි-

(අ) ඒ ඉවත් කිරීමේ ලිපිය ලැබුණු දිනයට පෙරාතුව වූ දිනයක් නොවන, ඒ ඉවත් කිරීම බලාත්මක විය යුතු දිනය; සහ

(ආ) ඒ ඉවත් කිරීමට හේතු,

සඳහන් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුගේ ධුරය (2) වන උපවගන්තිය යටතේ කරුණු විභාග කිරීම ආරම්භ කිරීමට පෙරාතුව හෝ කරුණු විභාග කිරීම සිදු කරන අතරතුර ජනාධිපතිවරයා විසින් අත්හිටවනු ලැබිය හැකි ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8 වැනි වගන්තිය සභා සම්මත විය.

9 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 23 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''කරුණු එකී තීරණය ගනු ලබන රැස්වීමට පැමිණ ඡන්දය දෙන කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් එසේ තහවුරු කරන ලද''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තිය සභා සම්මත විය.

11 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 8 වැනි සහ 9 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(ආ) තහනම් ප්‍රකාශ සන්නිවේදනය කරන තැනැත්තන්ට, එකී ප්‍රකාශ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 12 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 24 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"එකී සන්නිවේදනයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව යටතේ හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතයක් යටතේ උචිත අධිකරණයකට යොමු කිරීම;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 28 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඊ) තහනම් ප්‍රකාශ ඉවත් කිරීම සඳහා අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදියන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 9 වැනි පිටුවේ 8 සහ 9 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(එ) කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් විමර්ශන සිදු කිරීම";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 6 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ට) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කරවීම සහ ඉවත් කිරීම සහ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම; සහ".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 10 වැනි පිටුවේ 20 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: පැති සටහනේ "සිද්ධි පිළිබඳ අසත්‍ය ප්‍රකාශ" යන වචන ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අසත්‍ය ප්‍රකාශ''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 10 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අනුව්‍යවස්ථාව යටතේ හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක් යටතේ අධිකරණයට අපහාස කිරීමේ වරද සඳහා'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 10 වැනි පිටුවේ 29 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''වූ අසත්‍ය ප්‍රකාශයක් මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා සන්නිවේදනය කරන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 11 වැනි පිටුවේ 1 සහ 2 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ඒ ව්‍යවස්ථාවේ සහ අදාළ ලිඛිත නීතියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තැනැත්තාට දඬුවම්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 11 වැනි පිටුවේ 4 වැනි පේළියේ සිට 8 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''14. ප්‍රකෝප කරවීමෙන් හෝ පෙළඹවීමෙන් කැරලි ගැසීමේ වරද සිදුවිය හැකි බවට වූ චේතනාවෙන් ම හෝ ඒ බව දැන දැන ම, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු විසින්, ද්වේශ සහගතව හෝ නිකරුණේ මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීමෙන් යම් තැනැත්තකු ප්‍රකෝප කරවනු ලැබූ හෝ පොලඹවනු ලැබූ අවස්ථාවකදී -'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 11 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 11 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 11 වැනි පිටුවේ 26 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 11 වැනි පිටුවේ 20 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

16 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 12 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 12 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

17 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 12 වැනි පිටුවේ 14 වැනි පේළියේ සිට 25 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පාත්‍රකිරීමේ ඒකාන්ත සහ ද්වේශ සහගත චේතනාවෙන්, මාර්ගගත ගිණුමක් මඟින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා වාචික හෝ ලිඛිත වචන මගින් හෝ දෘශ්‍යමය නිරූපණ මගින් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීමෙන් ඒ පන්තියේ ආගමට නැතහොත් ආගමික විශ්වාසවලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත් කරන

ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර තුනක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය සහ දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

18 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 12 වැනි පිටුවේ 33 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''නාමයට හෝ දේපළවලට පිඩාවන් සිදුවන'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: පැති සටහනේ ''වංචා කිරීම'' යන වචන ඉවත් කර ඒ වෙනුවට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''මාර්ගගතව වංචා කිරීම''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 13 වැනි පිටුවේ 7 වැනි පේළියේ සිට 13 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''මාර්ගගතව වංචා කිරීමේ'' වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට වසර හතක් දක්වා දීර්ඝ විය හැකි කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ හතකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

19 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 13 වැනි පිටුවේ 15 වැනි පේළියේ සිට 29 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(අ) තමා වෙනත් තැනැත්තකු ලෙස ඇඟවීමෙන්;

(ආ) එක් තැනැත්තකු වෙනුවට තවත් තැනැත්තකු දැන දැනම ආදේශ කිරීමෙන්; හෝ

(ඇ) තමා හෝ වෙනත් යම් තැනැත්තකු සත්‍ය වශයෙන් ම තමා හෝ එකී වෙනත් යම් තැනැත්තා නොවන අන් තැනැත්තකු ලෙස ඉදිරිපත් කිරීමෙන්,

වංචා කරන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු, "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මාර්ගගතව වංචා කිරීමේ" වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට වසර තුනක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: පැති සටහනේ "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම" යන වචන ඉවත් කර ඒ වෙනුවට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මාර්ගගතව වංචා කිරීම"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 13 වැනි පිටුවේ 14 වැනි පේළියේ සිට 29 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 15 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

21 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 25 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ හතක් නොඉක්මවන දඩයකට හෝ "ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

22 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 15 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ප්‍රකාශයක් සිතාමතා ම සිදු කරන හෝ සන්නිවේදනය".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: පැති සටහනේ "සිද්ධියක් පිළිබඳ ප්‍රකාශ" යන වචන ඉවත් කර ඒ වෙනුවට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ප්‍රකාශ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

23 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 16 වැනි පිටුවේ 12 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ළමා අපයෝජන යනාදිය

**23.** (1) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 288, 288අ, 288ආ, 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ වගන්තියේ අර්ථානුකූලව වරදක් සංයුක්ත වන ක්‍රියාවක් ළමයකු සම්බන්ධයෙන් සිදු කරන හෝ එවැනි ක්‍රියාවකට ආධාර දෙන සහ අනුබල දෙන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට මෙහි උපලේඛනයේ එම එක් එක් වරද සඳහා නිශ්චිතව දක්වා ඇති දඬුවමට යටත් විය යුතු ය:

එසේ වුව ද, ළමයකු සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 363 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට ආධාර කිරීමක දී සහ අනුබල දීමක දී, මේ වගන්තියේ කාර්යය සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 364 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ස්ත්‍රියක්" යනුවෙන් යෙදෙන සෑම සඳහනක් ම "ළමයකු" ලෙසට කියවා තේරුම් ගත යුතු ය.

(2) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා ළමයකුට අදාළව අපයෝජන ස්වභාවයෙන් යුතු හෝ කාමෝද්දීපන ස්වභාවයෙන් යුතු යම් ඡායාරූපයක්, හඬ පටයක් හෝ වීඩියෝ පටයක් පළ කරන, ශ්‍රී ලංකාව තුළ හෝශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර දෙකකට නොඅඩු සහ වසර විස්සක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

24 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 17 වැනි පිටුවේ 11 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

25 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 17 වැනි පිටුවේ 15 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

26 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 18 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''තැනැත්තකුට, ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 19 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පරීක්ෂණ සිදු කළ යුතු ය. එකී පරීක්ෂණ අතරතුර දී, එකී තහනම් ප්‍රකාශය සන්නිවේදනය කළ බවට චෝදනා ලද තැනැත්තාට කරුණු කියාපෑමට අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 19 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"තහනම් ප්‍රකාශයෙන් හානියක් හෝ පීඩාවක් සිදු වීමට ඇති";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 20 වැනි පිටුවේ 19 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(9) (අ) (6) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක දී; හෝ

(ආ) (8) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම යම් අන්තර්ජාල සේවා සපයන්නකු හෝ අන්තර්ජාල අතරමැදියකු පැහැර හරින අවස්ථාවක දී,

අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාට හෝ අන්තර්ජාල සේවා සපයන්නාට හෝ අන්තර්ජාල අතරමැදියාට, එකී විධිවිධානවලට අනුකූල වන ලෙසට විධාන කරන ආඥාවක් ලබා ගැනීම සඳහා පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින්, කොමිෂන් සභාව විසින්, මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර 27 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී ඉල්ලීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

27 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 23 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" (9) මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ යම්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 23 වැනි පිටුවේ 13 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(i) ශ්‍රී ලංකාව තුළ ඒ තහනම් ප්‍රකාශය පිළිබඳ";

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 23 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 24 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 24 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

28 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 26 වැනි පිටුවේ 25 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(10) මේ වගන්තිය යටතේ, ආඥාවක් කරනු ලබන්නේ කවර'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 26 වැනි පිටුවේ 30 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''තැනැත්තා රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 27 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

29 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 27 වැනි පිටුවේ 11 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''තැනැත්තකු විසින්, ඒ අගතියට පත් තැනැත්තා වාසය කරන ප්‍රදේශයේ අධිකරණ බලය හිමි දිසා අධිකරණයේ පවරනු ලබන සිවිල් නඩු කටයුත්තක් ආකාරයෙන් ඉල්ලීමක්'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 27 වැනි පිටුවේ 22 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) ඒ ප්‍රකාශය සන්නිවේදනය වීම හේතුවෙන් ඇති වූ හානිය හෝ පීඩාව".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

30 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 28 වැනි පිටුවේ 4 වැනි පේළියේ සිට 15 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

31 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 29 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) පරිගණක සම්පත් සේවාවක්

(ඉ) යම් විද්‍යුත් තැපැල් පණිවුඩයක්, විද්‍යුත් තැපැල් සේවාවක් මගින් සක්‍රීය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත විද්‍යුත් තැපැල් පණිවුඩයක් පමණක් වන්නේ නම්, එවැනි කෙටි පණිවුඩ සේවාවක්;

(ඊ) (i) යම් කෙටි පණිවුඩයක්, කෙටි පණිවුඩ සේවා සපයන්නකු මගින් සක්‍රීය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත කෙටි පණිවුඩයක් පමණක් වන්නේ නම්, එවැනි කෙටි පණිවුඩ සේවාවක්;

(ii) යම් බහුමාධ්‍ය පණිවුඩයක්, බහුමාධ්‍ය පණිවුඩ සේවා සපයන්නකු මගින් සක්‍රීය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත බහුමාධ්‍ය පණිවුඩයක් පමණක් වන්නේ නම්, එවැනි බහුමාධ්‍ය පණිවුඩ සේවාවක්;

(iii) යම් කෙටි පණිවුඩයක් හා බහුමාධ්‍ය පණිවුඩයක්, කෙටි පණිවුඩ හා බහුමාධ්‍ය පණිවුඩ සේවා සපයන්නකු මගින් සක්‍රීය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත කෙටි පණිවුඩයක් හා බහුමාධ්‍ය පණිවුඩයක් පමණක් වන්නේ නම්,

එවැනි කෙටි පණිවුඩ (එස්.එම්.එස්) හා බහුමාධ්‍ය පණිවුඩ (එම්.එම්.එස්) සේවාවක්;

(උ) යම් එකිනෙකට වූ සජීවී ශ්‍රව්‍ය සන්නිවේදනයක්, සජීවී ශ්‍රව්‍ය සන්නිවේදන සේවා සපහන්නකු මගින් සක්‍රීය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත සජීවී ශ්‍රව්‍ය සන්නිවේදනයක් පමණක් වන්නේ නම්, එවැනි සජීවී ශ්‍රව්‍ය සන්නිවේදන සේවාවක්;

(2) (අ) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් සේවාවක් මගින් සන්නිවේදනය කරන ලද අසත්‍ය ප්‍රකාශයක්, තහනම් ප්‍රකාශයක් හෝ යම් දෙයක්, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හයක් ඇතුළත ඉවත් කරනු ලැබ ඇති අවස්ථාවකදී;හෝ

(ආ) තුන්වන පාර්ශ්වයන් විසින් යම් දෙයක් උඩුගත කරනු ලැබ ඇති හෝ යම් දෙයකට මැදිහත් වනු ලැබ ඇති අවස්ථාවක දී,

මාර්ගගත ගිණුමක හිමිකරුවකු හෝ සේවා සපයන්නකු, (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් කරන ලද ප්‍රකාශය හෝ දෙය සම්බන්ධයෙන් වගකීමකට යටත් නොවිය යුතුය.

‘‘සංශෝධනය පිළිගත යුතු ය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 29 වැනි පිටුවේ 11 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

‘‘(ඇ) සේවාව ලබා දීමේ දී මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට හෝ රීතියකට හෝ මේ පනත යටතේ සාදන ලද රීති ආකාරයෙන් කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන යම් චර්යා සංග්‍රහයකට අනුකූල වී නොමැති නම්,

අදාළ නොවිය යුතු ය.

(3) මේ පනත යටතේ සාදන රීති ආකාරයෙන් කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන අදාළ චර්යා සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන සහ එමගින් වෙනත් යම් තැනැත්තකුට අයුතු අලාභයක් සිදු කරනු ලබන යම් තැනැත්තකු අලාභය සිදු වූ තැනැත්තාට වන්දි ආකාරයෙන් අලාභ ගෙවීමට යටත් විය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා -

‘‘පරිගණක සම්පත් සේවාව’’ යන්නට, අන්තර්ජාල අතරමැදි සේවාවක්, විදුලි සංදේශ සේවාවක් හෝ අන්තර්ජාලයට මහජන ප්‍රවේශය ලබා දෙන සේවාවක් භාවිත කිරීමෙන් හැර වෙනත් ඕනෑම ආකාරයකින් තැනැත්තකු විසින් සපයනු ලබන අන්තර්ජාල සේවාවක් ඇතුළත් වේ;

‘‘විදුලි සංදේශ සේවාව’’ යන්නට, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.’’

‘‘සංශෝධනය පිළිගත යුතු ය’’ යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 28 වැනි පිටුවේ 16 වැනි පේළියේ සිට 28 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

උප ශීර්ෂය- ‘‘මැදිහත්කරු වගකීමෙන් මුක්තිය’’

(1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණද, (2)වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් සේවාවන් සැපයීමේ නිරතව සිටින යම් තැනැත්තකු, ඒ තැනැත්තා හිමිකාරිත්වය දරන, මෙහෙයවන හෝ පාලනය කරනු ලබන මාර්ගගත ස්ථානයකින් සන්නිවේදනය කරන ලද තහනම් ප්‍රකාශයක් සංසරණය වීම සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ වරදක් වන යම්

තහනම් ප්‍රකාශයක් අඩංගු වන සන්නිවේදන සබැඳියක් ඒ මාර්ගගත ස්ථානය හරහා අවසාන පරිශීලකයන් වෙත ලබාදීම සම්බන්ධයෙන් හෝ යම් අවිශ්වසනීය මාර්ගගත ගිණුමක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ලබාදෙන ලද යම් නියමයක් හෝ යම් තහනම් ප්‍රකාශයක් හෝ වෙනයම් සන්නිවේදනයක් මගින් යම් තැනැත්තකුට සිදුවූ යම් අයුතු හානියක් සඳහා ගෙවිය යුතු වන්දියක් සම්බන්ධයෙන් හෝ කිසිදු සිවිල් හෝ අපරාධමය වගකීමකට යටත් නොවිය යුතුය.

(අ) අන්තර්ජාල අතරමැදි සේවාවක්;

(ආ) අන්තර්ජාල සේවා සම්පාදකයෙක්;

(ඇ) ඩිජිටල් දැන්වීම්කරණ අතරමැදියෙකු; හෝ

(ඈ) පරිගණක සම්පත් සේවාවක්.

(2) (1) වන හා (2) වන උපවගන්ති යටතේ ලබාදෙනු ලබන වගකීමෙන් මුක්තිය, ඒ තැනැත්තා විසින් -

(අ) සන්නිවේදනය නිර්මාණය කොට ආරම්භ කොට ඇත්තේ නම්; හෝ

(ආ) මෙම පනතේ 36 වගන්තියට අනුව සකස් කරන ලදුව පනතේ 53 වන වගන්තිය යටතේ එන නියමයන් වශයෙන් සම්මත කරන ලද පිළිවෙත් සංග්‍රහයකට අනුගත නොවන්නේ නම්

අදාළ නොවිය යුතුය.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 29 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 14 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

32 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 29 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 23 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) 27 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් කොන්දේසි සහිත ආඥා නියත කරනු ලැබූ ඒ මාර්ගගත ස්ථානයෙහි එකිනෙකට වෙනස් තහනම් ප්‍රකාශ තුනක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් වෙත සන්නිවේදනය වී ඇත්නම්; සහ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 30 වැනි පිටුවේ 13 වැනි පේළියේ සිට 17 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඇ) (ඇ) ඡේදයේ සඳහන් දිනයෙන් වසර දෙකකට වඩා පසු නොවන දිනයක් විය යුතු, ඒ ප්‍රකාශයට පත් කිරීමේ කාලය ඉකුත් වන දිනය;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 31 වැනි පිටුවේ 3 වැනි සහ 4 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයට අනුකූලව එහි නිශ්චිතව දැක්වෙන දිනය; හෝ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 31 වැනි පිටුවේ 10 වැනි පේළියේ සිට 21 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වන දිනට පෙරාතුව, හැකිතාක් ඉක්මණින්, කොමිෂන් සභාව විසින්, නියම කරනු ලැබිය හැකි ආකෘතියට සහ ආකාරයට අනුව -

(අ) මේ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමක් නිකුත් කර ඇති බව දක්වමින්; සහ

(ආ) ප්‍රකාශයට පත් කිරීම අදාළ වන මාර්ගගත ස්ථානයේ යූ.ආර්.එල්., වසම් නාමය හෝ ඊට අනන්‍ය වූ වෙනත් යම් හඳුනා ගැනීමක් දක්වමින්,

ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 35 වැනි පිටුවේ 18 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(15) මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ කවර";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 35 වැනි පිටුවේ 33 වැනි පේළියේ සිට 35 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 36 වැනි පිටුවේ 1 වැනි සහ 2 වැනි පේළි ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 36 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"සඳහා (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයට පත් කිරීමක්".

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

33 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 37 වැනි පිටුවේ 23 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(3) අන්තර්ජාල අතරමැදියකු'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 37 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''කාලසීමාවකින් පසු, අන්තර්ජාල'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 38 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අන්තර්ජාල අතරමැදියකු''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

34 සහ 35 වැනි වගන්ති සභා සම්මත විය.

36 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 43 වැනි පිටුවේ 21 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''(11) මේ වගන්තිය යටතේ ආඥාවක් කරන ලද්දේ කවර'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 44 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ සංශෝධනයක්: 40 වැනි පිටුවේ 2 වැනි පේළිය සහ 3 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''කර්මාන්ත පිළිවෙත් සංග්‍රහය''

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 40 වැනි පිටුවේ 4 වැනි පේළියේ සිට 28 වැනි පේළිය දක්වා වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

පැති සටහන - ''කර්මාන්ත පිළිවෙත් සංග්‍රහය''

1. පහත සඳහන් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් කටයුතු කරනු පිණිස කොමිෂන් සභාව විසින් ''අන්තර්ජාල අතරමැදියන්'' හා ''අන්තර්ජාල සේවා සම්පාදකයන්'' වෙත අදාළ වන්නාවූ පිළිවෙත් සංග්‍රහයන් එකක් හෝ වැඩි ගණනක් නිකුත් කරනු ඇත:

(අ) වෛරී ප්‍රකාශ, ප්‍රචණ්ඩත්වය අවුලුවාලීම, සාවද්‍ය තොරතුරු, විකෘති තොරතුරු, සයිබර් බලපෑම් සහ හිරිහැර කිරීම් සහ මාර්ගගත ලිංගික සූරාකෑම සහ අපයෝජනයද ඇතුළත් හානිකර මාර්ගගත අන්තර්ගතයන් හා චර්යාවන් ආමන්ත්‍රණය;

(ආ) සම්බන්ධීකෘත අවිශ්වසනීය හැසිරීම් සහ වෙනයම් මාර්ගගත ගිණුම් අනිසි ලෙස භාවිතා කිරීමක් හඳුනා ගැනීම, පාලනය කිරීම සහ එවැනි තත්ත්වයන්ගෙන් ආරක්ෂා කිරීම;

(ඇ) හානිකර අන්තර්ගතයන් සීමා කිරීමට ගන්නා ලද ප්‍රායෝගික ක්‍රියාමාර්ගවලට අදාළ මෙහෙයුම් ප්‍රමිතීන් සහ විනිවිදභාවය පිළිබඳ වාර්තා කිරීම් සැකසීම.

(ඈ) නිර්දිෂ්ට ඩිජිටල් වෙළඳ ප්‍රචාරණ අතරමැදියන් හෝ නිර්දිෂ්ට ආකාරයේ ඩිජිටල් ප්‍රචාරණ අතරමැදියන්;

(ඉ) ශ්‍රී ලංකාව තුළ සන්නිවේදනය කරනු ලබන, දේශපාලන අරමුණක් සඳහා යොමු වූ ඕනෑම ගාස්තු ගෙවූ අන්තර්ගතයක් සම්බන්ධයෙන් අනුග්‍රාහකයා සහ අනෙකුත් තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ නිර්දිෂ්ට අන්තර්ජාල අතරමැදියන්; සහ

(ඊ) 11 වගන්තියේ (ඇ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් නියමයක් හා අනුගත විය යුතුවන කාල පරිච්ඡේදය

(3) මෙම වගන්තියේ (1) උපවගන්තිය තුළ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු පිණිස 1 වගන්තියේ (2) උපවගන්තිය තුළ නිර්දිෂ්ට ක්‍රියාත්මක කිරීමේ කාලයේ සිට මාස නවයක් ඇතුළත ස්වේච්ඡා පදනමකින් (මෙහි මින්මතු 'පිළිවෙත් සංග්‍රහය' ලෙස හැඳින්වෙන) කර්මාන්තමය පිළිවෙත් සංග්‍රහයක් සම්පාදනය කරනු පිණිස 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' වෙත අවස්ථාවක් ලබාදෙමින් කොමිෂන් සභාව විසින් (ගැසට් පත්‍රයක පළකරනු ලබන නියෝගයක් මගින්) නිවේදනයක් නිකුත් කළ යුතුය.

(4) (2) උපවගන්තිය තුළ නිර්දිෂ්ට ක්‍රියාත්මක කිරීමේ කාලයේ සිට මාස නවයක් ඇතුළත ස්වේච්ඡා පදනමකින් පිළිවෙත් සංග්‍රහයක් සම්පාදනය කිරීමට 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' හට නොහැකි වුවහොත්, හෝ 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' විසින් එය ඒකාබද්ධව සම්පාදනය කිරීමේ අභිලාශය කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබ කොමිෂන් සභාවද සමගින් පිළිවෙත් සංග්‍රහයකට එකඟ වුවහොත්, එවිට කොමිෂන් සභාව විසින් මෙම වගන්තියේ (1) උපවගන්තිය තුළ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු පිණිස පිළිවෙත් සංග්‍රහයක් සම්පාදනය කිරීමට පියවර ගත යුතුය.

(5) මෙම වගන්තියේ (3) උපවගන්තිය අනුව කොමිෂන් සභාව විසින් පියවර ගැනීමෙන් අනතුරුව විද්‍යුත් ස්වරූපයෙන් පිළිවෙත් සංග්‍රහයක් පළකොට මාස තුනකට නොඅඩු කාල පරිච්ඡේදයක් ඇතුළත 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' වෙතින් අදහස්, නිරීක්ෂණ හා නිර්දේශද ලබාගෙන පිළිවෙත් සංග්‍රහය කෙටුම්පත ක්‍රියාත්මක කරනු පිණිස 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' සමඟ එකඟතාවයකට හා සම්මුතියකට එළැඹීමට පියවර ගැනීම කොමිෂන් සභාවේ කාර්ය වන්නේය.

(6) මෙම වගන්තියේ (4) උපවගන්තියට අනුගතව කොමිෂන් සභාව විසින් පිළිවෙත් සංග්‍රහ කෙටුම්පත සඳහා 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' වෙතින් අදහස්, නිරීක්ෂණ හා නිර්දේශද ලබාගෙන ඔවුන්ගේ එකඟතාවය හා සම්මුතියද ලබාගත් පසු කොමිෂන් සභාව විසින් 53 වගන්තිය ප්‍රකාර පිළිවෙත් සංග්‍රහය නිකුත් කිරීමට පූර්වයෙන් පිළිවෙත් සංග්‍රහය කෙටුම්පත සම්බන්ධයෙන් මහජන අදහස් විමසීම් සිදු කිරීමට පියවර ගත යුතුය.

(7) 53 වගන්තිය හා අනුගතව පිළිවෙත් සංග්‍රහය නියමයක් ලෙස ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව, මෙම වගන්තිය හා අනුගතව සම්පාදිත පිළිවෙත් සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' බැඳී සිටී.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 41 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 42 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 33 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 43 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 34 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 44 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 4 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධන පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 51; විරුද්ධව 92; යනුවෙන් බෙදී, එය නිෂ්ප්‍රභ විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය හතළිස් දෙනෙකු (140) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Pavithradevi Wanniarachchi | No |
| G 002. Nimal Siripala De Silva | No |
| G 003. Chamal Rajapaksa | No |
| G 005. Prasanna Ranatunga | No |
| G 006. Susil Premajayantha | No |
| G 007. Dinesh Gunawardena | No |
| G 009. Douglas Devananda | No |

| | |
|---|---|
| G 010. Bandula Gunawardana | No |
| G 011. Keheliya Rambukwella | No |
| G 012. Mahinda Amaraweera | No |
| G 013. Wijeyadasa Rajapakshe | No |
| G 015. Ramesh Pathirana | No |
| G 017. Vidura Wickramanayaka | No |
| G 018. Kanchana Wijesekera | No |
| G 019. Manusha Nanayakkara | No |
| G 020. Tiran Alles | No |
| G 021. Ajith Rajapakse | No |
| G 022. Nalin Fernando | No |
| G 024. Ranjith Siyambalapitiya | No |
| G 025. Jagath Pushpakumara | No |
| G 026. Dilum Amunugama | No |
| G 027. Mohan Priyadarshana De Silva | No |
| G 028. Janaka Wakkumbura | No |
| G 029. Shehan Semasinghe | No |
| G 030. Kanaka Herath | No |
| G 031. Thenuka Vidanagamage | No |
| G 032. Pramitha Bandara Tennakoon | No |
| G 034. Rohana Dissanayaka | No |
| G 037. Vijitha Berugoda | No |
| G 038. Lohan Ratwaththe | No |
| G 039. Sanath Nishantha | No |
| G 040. Tharaka Balasuriya | No |
| G 041. Indika Anuruddha Herath | No |
| G 042. Siripala Gamalath | No |
| G 043. Anuradha Jayaratne | No |
| G 044. S. Viyalanderan | No |
| G 045. D.V. Chanaka | No |
| G 046. Sisira Jayakody | No |
| G 047. Piyal Nishantha De Silva | No |
| G 048. Prasanna Ranaweera | No |
| G 049. D. B. Herath | No |
| G 050. Shasheendra Rajapaksa | No |
| G 051. Seetha Arambepola | No |

| | |
|---|---|
| G 052. Shantha Bandara | No |
| G 055. A. Aravindh Kumar | No |
| G 056. Geetha Samanmale Kumarasinghe | No |
| G 057. Suren Raghavan | No |
| G 058. Diana Gamage | No |
| G 059. Sivanesathurai Santhirakanthan | No |
| G 060. Chamara Sampath Dasanayake | No |
| G 061. Anupa Pasqual | No |
| G 064. Gamini Lokuge | No |
| G 068. S. M. Chandrasena | No |
| G 069. Mahindananda Aluthgamage | No |
| G 072. Sarath Weerasekara | No |
| G 073. Wimalaweera Dissanayaka | No |
| G 074. Roshan Ranasinghe | Yes |
| G 076. Kapila Athukorala | No |
| G 077. Gayashan Nawananda | No |
| G 079. Jayantha Ketagoda | No |
| G 080. Sampath Athukorala | No |
| G 082. U. K. Sumith Udukumbura | No |
| G 084. Sanjeeva Edirimanna | No |
| G 085. Akila Ellawala | No |
| G 087. Karunadasa Kodithuwakku | No |
| G 088. Nalaka Bandara Kottegoda | No |
| G 089. Udayakantha Gunathilaka | No |
| G 090. Kokila Gunawardene | No |
| G 091. Milan Jayathilake | No |
| G 092. Kulasingam Dhileeban | No |
| G 093. Sudarshana Denipitiya | No |
| G 094. Isuru Dodangoda | No |
| G 095. Premnath C. Dolawatte | No |
| G 096. H. Nandasena | No |
| G 097. Muditha Prishanthi | No |
| G 098. Sudath Manjula | No |
| G 099. Mayadunna Chinthaka Amal | No |
| G 100. Nipuna Ranawaka | No |
| G 101. Kumarasiri Rathnayaka | No |

| | |
|---|---|
| G 103. Upul Mahendra Rajapaksha | No |
| G 105. Rajika Wickramasinghe | No |
| G 106. M. W. D. Sahan Pradeep Withana | No |
| G 107. Madhura Withanage | No |
| G 108. D. Weerasingha | No |
| G 109. Samanpriya Herath | No |
| G 110. Sagara Kariyawasam | No |
| G 111. Yadamini Gunawardena | No |
| G 112. Manjula Dissanayake | No |
| G 114. Jayantha Weerasinghe | No |
| G 115. Marjan Faleel | No |
| G 116. Lalith Varna Kumara | No |
| O 001. Rishad Bathiudeen | Yes |
| O 002. Rajitha Senarathne | Yes |
| O 005. Rauff Hakeem | Yes |
| O 006. Gayantha Karunatilleka | Yes |
| O 007. Lakshman Kiriella | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 009. Kumara Welgama | Yes |
| O 010. Patali Champika Ranawaka | Yes |
| O 012. Mano Ganesan | Yes |
| O 013. Maithreepala Sirisena | Yes |
| O 015. G.L. Peiris | Yes |
| O 016. Anura Dissanayaka | Yes |
| O 017. A. L. M. Athaullah | Yes |
| O 018. G. G. Ponnambalam | Yes |
| O 022. Kabir Hashim | Yes |
| O 024. Abdul Haleem | Yes |
| O 026. Harsha De Silva | Yes |
| O 028. R. M. Ranjith Madduma Bandara | Yes |
| O 030. Niroshan Perera | Yes |
| O 031. Eran Wickramaratne | Yes |
| O 032. J. C. Alawathuwala | Yes |
| O 036. Dullas Alahapperuma | Yes |
| O 037. Vijitha Herath | Yes |
| O 046. Ali Zahir Moulana Seyad | Yes |

| | |
|---|---|
| O 048. Buddhika Pathirana | Yes |
| O 049. M. S. Thowfeek | Yes |
| O 050. Nalin Bandara Jayamaha | Yes |
| O 051. Hector Appuhamy | Yes |
| O 052. Thushara Indunil Amarasena | Yes |
| O 053. Dilan Perera | Yes |
| O 057. Harini Amarasuriya | Yes |
| O 066. Imran Maharoof | Yes |
| O 072. M. Udayakumar | Yes |
| O 075. Chandima Weerakkody | Yes |
| O 077. Sivagnanam Shritharan | Yes |
| O 078. M. A. Sumanthiran | Yes |
| O 080. S. Rajaputhiran Rasamanickam | Yes |
| O 081. W. H. M. Dharmasena | Yes |
| O 082. Kins Nelson | Yes |
| O 083. Rohana Bandara | Yes |
| O 089. Nimal Lanza | No |
| O 091. B. Y. G. Rathnasekara | Yes |
| O 092. Sarathie Dushmantha | Yes |
| O 095. Udayana Kirindigoda | Yes |
| O 101. S. Jagath Samarawickrama | No |
| O 107. Wasantha Yapabandara | Yes |
| O 110. Weerasumana Weerasinghe | Yes |
| O 111. Gevindu Cumaratunga | Yes |
| O 112. Charitha Herath | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තුන්දෙනෙකුගේ (03) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| Field Marshal Sarath Fonseka | Yes |
| V. Radhakrishnan | Yes |
| Dayasiri Jayasekara | Yes |

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

37 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 44 වැනි පිටුවේ 8 වැනි පේළියේ සිට 31 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"විමර්ශනවලට සහාය වීම සඳහා විශේෂඥයන් පත් කිරීම

37. (1) අමාත්‍යවරයා විසින්, අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින්, මේ පනත යටතේ වූ වරදක් විමර්ශනය කිරීමේ දී කොමිෂන් සභාවට සහාය වීම සඳහා, (මෙහි මින්මතු "විශේෂඥයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ශිල්පය හෝ මෘදුකාංග තාක්ෂණය පිළිබඳව නියම කරන ලද සුදුසුකම් සහ පළපුරුද්ද සහිත, රජයේ නිලධරයකු හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ආණ්ඩුවේ සමාගමක සේවා නියුක්තයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා

"විශේෂඥයා" යන්නට-

(අ) නියම කරන ලද සුදුසුකම් සහිත සහ අදාළ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන, යම් විශ්වවිද්‍යාලයක කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු;

(ආ) අදාළ විශ්වවිද්‍යාලයේ මතය අනුව නියම කරන ලද සුදුසුකම් සහිත සහ එකී විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන යම් රාජ්‍ය ආයතනයක්;

ඇතුළත් වේ:

එසේ වුව ද, ඉහත (අ) ඡේදය හෝ (ආ) ඡේදය ප්‍රකාරව "විශේෂඥයකු" හඳුනාගත නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, අදාළ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විමසා, නියම කරන ලද සුදුසුකම් සපුරාලන වෙනත් යම් ආයතනයක් පත් කරනු ලැබිය හැකිය;

"ආණ්ඩුවේ සමාගම" යන්නෙන්, ආණ්ඩුව හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් ඒ සමාගමේ කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරන්නා වූ, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති ලෙස සලකනු ලබන සමාගමක් අදහස් වේ;

“විශ්වවිද්‍යාලය” යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් විශ්වවිද්‍යාලයක් අදහස් වේ.

(3) (විශේෂඥතාව ඇති නිශ්චිත ක්ෂේත්‍රයන් සැලකිල්ලට ගෙන) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයකු විසින් සපුරාලනු ලැබීමට නියම කරන ලද සුදුසුකම් සහ පළපුරුද්ද සහ ඔවුන් පත් කිරීමේ ආකාරය සහ ක්‍රමවේදය සහ ඒ නිලධරයා පත් කිරීමේ කොන්දේසි නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) මේ පනත යටතේ වන විමර්ශනයක කාර්යය සඳහා, කොමිෂන් සභාවට සහාය වීමට කැඳවනු ලබන විශේෂඥයකුට-

(අ) උපපොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකු සමඟ යම් පරිශ්‍රයකට ඇතුළුවීමට;

(ආ) යම් කර්තව්‍යයක් ඉටු කිරීමට හෝ එවැනි වෙනත් යම් දෙයක් කිරීමට යම් තොරතුරු පද්ධතියකට, පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට හෝ පරිගණකයක ඇති යම් වැඩසටහනකට, දත්තවලට හෝ තොරතුරුවලට ප්‍රවේශවීමට;

(ඇ) යම් හුවමාරු වන දත්ත හෙළිදරව් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට;

(ඈ) යම් තැනැත්තකු වාචිකව ප්‍රශ්න කිරීමට; සහ

(ඉ) මේ පනතේ කාර්ය සඳහා, සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි වෙනත් යම් දේ කිරීමට,

බලය තිබිය යුතු ය.

(5) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් විශේෂඥයකු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ වන වරදක් විමර්ශනය කිරීමේදී කොමිෂන් සභාවට හෝ යම් පොලිස් නිලධරයකුට සහායවීම සඳහා විශේෂඥයකු කැඳවනු ලැබිය හැකි අතර, එකී විමර්ශනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු සහාය ලබාදීම විශේෂඥයාගේ කාර්යය විය යුතු ය. යම් විමර්ශනයකින් සොයා දැනගත් කරුණුවල

ප්‍රතිඵලයක් ලෙස යම් නඩු කටයුත්තක් ආරම්භ වී ඇති අවස්ථාවක දී, එකී විමර්ශනය අතරතුර දී ඔහු විසින් ලබා ගනු ලැබිය හැකි යම් තොරතුරු, දත්ත, ද්‍රව්‍ය හෝ වෙනත් දේ එකී නඩු කටයුත්තේ කාර්යය සඳහා ලබා ගැනීමට සැලැස්වීම එකී විශේෂඥයාගේ කාර්යය විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 45 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 30 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 46 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 5 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

38 වැනි වගන්තියේ සිට 41 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

42 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 47 වැනි පිටුවේ 23 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"42. (1) මේ පනතේ ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇති පරිදි හැර, විමර්ශන, නඩු කටයුතු පැවරීම, වැරදි සම්බන්ධයෙන් වන නඩු විභාග සහ මේ පනත යටතේ එවැනි යම් නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරනු ලබන නඩු තීන්දු, දණ්ඩන නියම සහ ආඥාවක් සම්බන්ධයෙන්";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 47 වැනි පිටුවේ 28 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(2) කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ පවත්වනු ලබන විමර්ශනයක් අතරතුර රැස්කර ගන්නා ලද කරුණු සැලකිල්ලට ගෙන යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන වරදක් සිදු කර ඇති බවට සෑහීමට පත්වන්නේ නම් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136 වන වගන්තිය ප්‍රකාරව අපරාධ නඩු කටයුතු පැවරීමට පියවර ගනු ලැබිය හැකි ය.".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

43 සහ 44 වැනි වගන්ති සභා සම්මත විය.

45 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 48 වැනි පිටුවේ 18 වැනි පේළියේ සිට 26 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "45. මේ පනත යටතේ වූ වරදකට අනුබල දෙන තැනැත්තකු".

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

46 වැනි වගන්තියේ සිට 52 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

53 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 53 වැනි පිටුවේ 14 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

54 සහ 55 වැනි වගන්ති සභා සම්මත විය.

56 වැනි වගන්තිය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 54 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "56. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 55 වැනි පිටුවේ 1 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "සංඛ්‍යාවකට අසත්‍ය ප්‍රකාශයක් හෝ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 55 වැනි පිටුවේ 17 වැනි පේළියේ සිට 27 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 55 වැනි පිටුවේ 28 වැනි පේළියේ සිට 32 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 56 වැනි පිටුවේ 19 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

'' ''අන්තර්ජාල සේවා සපයන්නා'' යන්නෙන්, 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනත යටතේ විදුලි සංදේශ සේවා සපයන්නන් ද ඇතුළුව,'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 57 වැනි පිටුවේ 17 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සේවාවක්;හෝ

(ඇ) අන්තර්ජාලය මත පදනම් වූ සේවාවක් මඟින් මාර්ගගත ස්ථානවල හිමිකරුවන් හෝ මෙහෙයුම්කරුවන් සහ ප්‍රචාරකයන් සහ සේවා සපයන්නන් අතර වන සබැඳිය හෝ සබැඳියේ කොටසක් ලෙස කටයුතු කිරීමෙන් යම් ස්ථානයක ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයන් සන්නිවේදය කිරීම සඳහා පහසුකම් සලසන සේවාවක්,'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 58 වැනි පිටුවේ 20 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

''පළ කිරීම'' යන්නෙන්, අන්තර්ජාලය මත හෝ හරහා ජනතාව වෙත යමක් ලබාදීම අදහස් වේ.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 58 වැනි පිටුවේ 21 වැනි පේළියේ සිට 27 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 59 වැනි පිටුවේ 21 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

''(2) මේ පනතේ භාවිත කරනු ලැබ අර්ථ දක්වනු නොලැබූ නමුත් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ දක්වා ඇති, යම් වචනයකට හෝ යෙදුමකට දණ්ඩ නීති සංග්‍රහයේ ඒ වචනයට හෝ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය.''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

57 වැනි වගන්තිය සභා සම්මත විය.

අලුත් උපලේඛනය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 59 වැනි පිටුවේ 23 වැනි පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කිරීමට:—

"උපලේඛනය

(23(1) වන වගන්තිය)

| දණ්ඩනීති සංග්‍රහයේ වගන්තිය | දණ්ඩනීති සංග්‍රහය යටතේ වරද | දඬුවම |
|---|---|---|
| 286අ | ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළකිරීම්, ප්‍රදර්ශන ආදිය. | අවුරුදු දෙකකට නොඅඩුවූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළයුතු අතර දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි ය. |
| 288 | ළමයින්ට සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම | අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකට ද යටත් කරනු ලැබිය හැකි ය. |
| 288අ | ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම | අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකට ද යටත් කරනු ලැබිය හැකි ය. |
| 288ආ | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම | අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු හතකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකට ද යටත් කරනු ලැබිය හැකි ය. |

| | | |
|---|---|---|
| 308අ | ළමයින් කෲරත්වයට භාජනය කිරීම | අවුරුදු දෙකකට නොඅඩු වූ ද, අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. තව ද, ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදුකරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. |
| 360අ | කූට්ටනය | අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. |
| 360ආ | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජනය ගැනීම | අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. |
| 360ඇ | තැනැත්තන් වෙළඳාම් කිරීම | අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. |
| 363 | ස්ත්‍රී දූෂණය | අවුරුදු හතකට නොඅඩු වූ ද, අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් සහ ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය |

| | | |
|---|---|---|
| | | විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු අතර, එකී වන්දි මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් අතිරේකව අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බන්ධනාගාර ගත කිරීමකට යටත් විය යුතු ය. |
| | (අ) තමාගේ භාරයේ සිටින ස්ත්‍රියක් රජයේ නිලධරයකු විසින් දූෂණය කිරීම<br><br>(ආ) රක්ෂණ නිවාසයක හෝ කාන්තා හෝ ළමා ආයතනයක යනාදියක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින් ඒ නිවාසයේ හෝ ආයතනයේ නේවාසික ස්ත්‍රියක් දූෂණය කිරීම<br><br>(ඇ) රෝහලක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින් ඒ රෝහලේ ස්ත්‍රියක් දූෂණය කිරීම | අවුරුදු දහයකට නොඅඩු වූ ද, අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් සහ ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු අතර, එකී වන්දි මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් අතිරේකව අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බන්ධනාගාර ගත කිරීමකට යටත් විය යුතු ය. |
| | (ඈ) ගර්භනී ස්ත්‍රියක් දූෂණය කිරීම<br><br>(ඉ) අවුරුදු දහඅටකට අඩු ස්ත්‍රියක් දූෂණය කිරීම<br><br>(ඊ) මානසික වශයෙන් හෝ ශාරීරික වශයෙන් ආබාධිත ස්ත්‍රියක් දූෂණය කිරීම. | |

| | | |
|---|---|---|
| | (උ) රංචු ගැසී ස්ත්‍රී දූෂණය කිරීම<br>අවුරුදු දහසයකට අඩු ස්ත්‍රියක් දූෂණය කරනු ලැබූ අවස්ථාවක දී ඒ පුරුෂයාට ඒ ස්ත්‍රිය කෙරෙහි 364අ වන වගන්තියේ දක්වා ඇති ඥාති සම්බන්ධතාවලින් කිසිවක් වේ නම් | අවුරුදු පහළොවකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය. |
| 364 අ | ව්‍යභිචාරය | අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය. |
| 365 | අස්වාභාවික වැරදි | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර ඒ සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය. |
| 365අ | තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර ඒ සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය. |

| | | |
|---|---|---|
| 365ආ | බරපතල ලිංගික අපයෝජනය | අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර ඒ සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.”. |

“උපලේඛනය දෙවැනිවර කියවිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

“උපලේඛනය පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පොදු සංශෝධන

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්:

මේ පනත් කෙටුම්පතේ -

(අ) “අන්තර්ජාල ප්‍රවේශ සේවා සපයන්නා” යන වචන සඳහන් වන කවර හෝ අවස්ථාවක දී ඒ වචන වෙනුවට “අන්තර්ජාල සේවා සපයන්නා” යන වචන ආදේශ කිරීමෙන්”;

(ආ) “සේවා සපයන්නා” යන වචන සඳහන් වන කවර හෝ අවස්ථාවක දී ඒ වචන වෙනුවට “අන්තර්ජාල සේවා සපයන්නා” යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) “ඩිජිටල් ප්‍රචාරණ අතරමැදියා” යන වචන සඳහන් වන කවර හෝ අවස්ථාවක දී ඒ වචන වෙනුවට “අන්තර්ජාල අතරමැදියා” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඈ) “සතියක්” යන වචනය යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වචනය වෙනුවට “සති දෙකක්” යන වචන ආදේශ කිරීමෙන්,

“සංශෝධන පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“පොදු සංශෝධන සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

දීර්ඝ නාමය

මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ දීර්ඝ නාමය පහත දැක්වෙන සංශෝධනය ඇතුළත් කිරීමට:—

(1) “ශ්‍රී ලංකාව තුළ සිද්ධියක් පිළිබඳ ඇතැම් ප්‍රකාශ මාර්ගගත ලෙස සන්නිවේදනය කිරීම තහනම් කිරීම පිණිස විධිවිධාන සැලසීම සඳහා ද;”

යන වචන ඉවත් කර ඒ වෙනුවට ''මාර්ගගතව සිදු කරනු ලබන තහනම් ප්‍රකාශවලින් ආරක්ෂාව සැලසීම සඳහා ද;'' යන වචන ආදේශ කරන්න; සහ

(2) ''සිද්ධියක් පිළිබඳ අසත්‍ය ප්‍රකාශ'' යන වචන ඉවත් කර ඒ වෙනුවට ''තහනම් ප්‍රකාශ'' යන වචන ආදේශ කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධන සහිතව තුන්වැනිවර කියවිය යුතු ය''යි මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**12. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ නියෝග:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 24 වගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජුනි 01 දිනැති අංක 2334/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.12.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 නොවැම්බර් 01 දිනැති අංක 2356/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. විදේශ විනිමය පනත යටතේ නියමය:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 20 දිනැති අංක 2363/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.11 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ඇතුළු ජල මූලාශ්‍ර මගින් පැන නැගී ඇති ගැටලු පිළිබඳව ගැඹුරින් විමර්ශනය කර නව ප්‍රතිනිර්මාණ යෝජනාවලියක් සැකසීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— මාතර දිස්ත්‍රික්කයේ ගොන්ගල හා රක්වාන කඳු පන්තිය ආශ්‍රිතව පැන නගින නිල්වලා ගඟ හා ගිං ගඟ පිළිවෙළින් මාතර හා ගාල්ල දිස්ත්‍රික්ක හරහා ගලා ගොස් මුහුදට එකතු වන අතර පොල්වත්ත ගඟ ද එවැනිම වැදගත් ජල මූලාශ්‍රයක් වන හෙයින්ද;

ලන්දේසි පාලන යුගයේ මෙම ගංගාවන්හි ජල කළමනාකරණය හා ගංවතුර කළමනාකරණය කෙරෙහි මුලින්ම අවධානය යොමු වී ඇති අතර නිදහස් ශ්‍රී ලංකාවේ ගිං හා නිල්වලා ගංගාවන්හි ජලය ගිනිකොනදිග ලංකාව හෙවත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පෝෂණය සඳහා යොදා ගැනීම පිළිබඳව මුල් යෝජනාව එවකට අකුරැස්ස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූ දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මහතා විසින් 1950 දශකයේදී ඉදිරිපත් කර ඇති හෙයින් ද;

ගිං හා නිල්වලා ගංගා ආශ්‍රිත ජලය කළමනාකරණය කරමින් වාර්ෂිකව ඇතිවන ගංවතුර කළමනාකරණය කර එම ජලය දිස්ත්‍රික්ක දෙකෙහි ජනතාවගේ මානව ක්‍රියාකාරකම්, කෘෂිකාර්මික හා කර්මාන්ත ක්‍රියාවලිය, ජෛව විවිධත්වය හා පරිසර තුලාතාවය පවත්වා ගෙන යාම උදෙසා විධිමත්ව යොදා ගැනීම පිළිබඳව ඉන්පසු විවිධ විශේෂඥයින් විසින් වාර්තා ඉදිරිපත් කර ඇති හෙයින් ද;

1977 න් පසු නිල්වලා ගඟ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුවද එය 1987–1989 වකවානුවේ රටේ පැවැති වාතාවරණය හේතුවෙන් අතරමඟ නතර කෙරුණු අතර, ඒ හේතුවෙන් නිල්වලා ගඟ ආශ්‍රිතව ගොවිබිම්, පුරන්බිම් බවට පත්වූ අතර, ගංවතුර තර්ජනය නොවෙනස්ව ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් නියං සමයේ කරදිය නිල්වලා ගඟ ඔස්සේ ඉහළට ගමන් කරමින් පානීය ජලයට මෙන්ම ගොවිබිම්වලට ද කරදිය මුසුවීම හේතුවෙන් බරපතල ගැටලු ඇති වූ අතර, ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද නිල්වලා ලවණ බාධකය හේතුවෙන් මේ වනවිට ගංවතුර අඛණ්ඩව ගොවිබිම් තුළ රැඳීම තුළින් වී, කුරුඳු, එළවළු, පොල් හා වෙනත් බෝග වගාවන්ට මෙන්ම කිරි ගොවීන් ද දුෂ්කරතා රැසකට මුහුණපාන ඛේදනීය තත්ත්වයක් නිර්මාණය වී ඇති හෙයින් ද;

ගිං ගඟ ආශ්‍රිතව ලවණ බාධකය සාර්ථක වූ අතර, නිල්වලා ගඟ ආශ්‍රිත ලවණ බාධකය අසාර්ථක වීම පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කළ යුතු තත්ත්වයක් වර්ධනය වී ඇති හෙයින් ද;

(අ) නිදහස් ශ්‍රී ලංකාවේ දශක 7½ කට ආසන්න යුගය තුළ ගිං සහ නිල්වලා ගංගා පිළිබඳව විද්වත් හා විශේෂඥයින් කරන ලද අධ්‍යයනයන් පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කර එකී යෝජනාවන්හි ඇති සාධනීය ලක්ෂණ හඳුනාගැනීමට ද;

(ආ) නිල්වලා හා ගිං ගංගාවන් හි ඉහළ ද්‍රෝණියේ අතිරික්ත ජලය ගිණිකොන දිග ලංකාවට ගෙනයාම පිළිබඳව විද්‍යාත්මක පදනමකින් මෙන්ම ජන ජීවිතයට අවම

පීඩනයක් ඇති වන ආකාරයෙන් කටයුතු කිරීමේ ක්‍රමවේද සම්බන්ධයෙන් ප්‍රායෝගික වැඩපිළිවෙළක් නිර්මාණය කිරීම පිළිබඳව යෝජනා ලබා ගැනීමට ද;

(ඇ) ඉහත (ආ) හි සංවර්ධන යෝජනාව මෙයට පෙර ක්‍රියාත්මක කිරීමට අදාළව ගන්නා ලද ක්‍රියාමාර්ග/වියදම් කරන ලද දේශීය හා විදේශීය අරමුදල්වල ඵලදායිතාව පිළිබඳව ගැඹුරින් විමර්ශන සිදු කිරීමට ද;

(ඈ) නිල්වලා ලවණ බාධකය හේතුවෙන් පැන නැගී ඇති සියලුම ආකාරයේ පීඩාවන් ඉවත් කිරීමට ගතයුතු කඩිනම් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන යෝජනා සකස් කර ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්දේශ ලබා දීමට ද;

(ඉ) දිස්ත්‍රික්කයේ ජල පාරිභෝගිකයන් මෙන්ම අනාගතයේ පුළුල් කළ හැකි ජල ව්‍යාපෘති සඳහා දිගිලිඔය ඇතුළු ප්‍රදේශ තුළ උචිත නව ජල පවිත්‍රකරණ මධ්‍යස්ථාන ගොඩනගා ගැනීම හඳුනාගැනීමට ද, දැනට ක්‍රියාත්මක ජල පොම්පාගාර පිළිබඳ විද්‍යානුකූල පදනමින් විශ්ලේෂණය කරමින් නව ක්‍රමෝපායන් යෝජනා කිරීමට ද;

(ඊ) නිල්වලා ගඟ ආශ්‍රිතව සිදුවන කිඹුල්-මිනිස් ගැටුම පිළිබඳව තිරසර විසඳුමක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට ද;

(උ) දකුණු පළාතේ කාර්මික, කෘෂිකාර්මික, ජල විදුලි උත්පාදනය, පශු සම්පත් ක්ෂේත්‍රය වෙනත් මානව ක්‍රියාකාරකම් මෙන්ම ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින් නිල්වලා හා ගිං ගංගාවල ජලය මුහුදට ගලා යාමට ප්‍රථම උපරිම ක්ෂමතාවයකින් භාවිතා කිරීම සම්බන්ධයෙන් වූ අදාළ යෝජනා ලබා ගැනීමට ද;

(ඌ) හුදෙක් ගංවතුර වැළැක්වීමේ සංවර්ධන ව්‍යාපෘතියකින් ඔබ්බට ගොස් ගිං-නිල්වලා කඩිනම් බහු කාර්ය යෝජනා ක්‍රමයක් මඟින් ඇති වී ඇති ගැටලු සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට මෙන්ම, මෙකී ජල මූලාශ්‍රයන් ප්‍රවාහනය, මිරිදිය ධීවර කර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, සංස්කෘතික ප්‍රබෝධය උදෙසා භාවිතා කිරීමට අදාළ නව නිර්මාණශීලි ප්‍රවේශයන් හඳුනාගැනීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමට ද;

(එ) ගිං, නිල්වලා සහ පොල්වත්ත යන ගංගා ආශ්‍රිතව එකී ගංගාවලට එකතුවන අතු ගංගා/ආර හා එවැනි ආකාරයේ ජල පෝෂකයන් ආශ්‍රිතව මෙන්ම මෙකී ගංගා ද්‍රෝණි නිම්නයන් තුළ සිදු කළ යුතු සංවර්ධන ක්‍රියාවලීන් හඳුනාගැනීම, එකී ගංගා දෙපස රක්ෂිත ඇති කිරීම, අපද්‍රව්‍ය එක් කිරීම වළක්වා ගැනීම, මානව ක්‍රියාකාරකම් තුළින් ගංගා ජලය දූෂණය කරන්නා වූ ක්‍රමවේද පිටු දැකීම, අනවසර ඉදිකිරීම් මඟින් ජල මූලාශ්‍ර අවහිර කිරීම මෙන්ම ඇතැම් ජල විදුලි බලාගාර හරහා ගංගාවන්ට හා ජෛව විවිධත්වයට සිදු කරන හානි හඳුනාගෙන එකී තත්ත්වයන් පිටු දැකීමට අදාළ යෝජනා ඉදිරිපත් කිරිමට ද;

(ඒ) අතරමග නතර කරන ලද ඉහත ගංගාවලට අදාළ සංවර්ධන ව්‍යාපෘති තුළ ඉටු කළ යුතු අසම්පූර්ණ වැඩ කොටස් හඳුනා ගෙන එකී වැඩ කොටස් ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනා සැකසීම, අවශ්‍ය අවස්ථාවන්හිදී මෙකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සිදු කරන ලද වියදම් පිළිබඳ ව්‍යවහාරික විගණනයන් ඇතුළු සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීමට ද; සහ

(ඔ) ඉහත (එ) හි සඳහන් ගංගාවන්ට අදාළ වෙනත් කවර හෝ ඉටු කළ යුතු සංවර්ධන ක්‍රියාදාමයන් අතරමඟ නතර වූ ක්‍රියාදාමයන්, අසාර්ථක වූ ක්‍රියාදාමයන් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කර කෙටි කාලීනව, මධ්‍ය කාලීනව හා දිගු කාලීනව ක්‍රියාත්මක කිරීමට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ

කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත්කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101හි විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණද කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් (20)සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. සිය පළමු රැස්වීම් දිනයේ සිට මාස තුනක (03) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙන එවැනි අමතර කාලසීමාවක් තුළ හෝ කාරක සභාව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

කථානායකවරයා විසින් සභාවේ අවසරය ඇතිව මතු පළවන නිවේදනය කරන ලදී:—

"පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතාගෙන් ලිපියක් ලැබී ඇත. එම ලිපිය පාර්ලිමේන්තුවේ මහලේකම්වරිය විසින් දැන් කියවනු ලැබේ."

ඊට අනුකූලව, පහත සඳහන් ලිපිය පාර්ලිමේන්තුවේ මහලේකම්වරිය විසින් කියවන ලදී:—

"ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
2024 ජනවාරි මස 04 වැනි දින

පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය වෙත,
මහ ලේකම්තුමියනි,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වේත්‍රධාරි ධුරයෙන් විශ්‍රාම යාම

2018 සැප්තැම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හයවැනි වේත්‍රධාරි ලෙස පත්වූ මා එම ධුරයෙන් 2024 ජනවාරි මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම යාමට නියමිත බව ඔබතුමිය වෙත ගෞරවයෙන් දන්වා සිටිමි.

1981 වසරේ අග භාගයේ පාර්ලිමේන්තුවේ පරිපාලන දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණු මා සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ධුරය දක්වා උසස්වීම් ලැබ, 2000 වසර අග භාගය දක්වා එම දෙපාර්තමේන්තුවේ වසර 19ක් සේවය කිරීමෙන් පසු, 2001.01.01 දින සිට සහකාර වේත්‍රධාරි ධුරයට පත්වී එම ධුරයේ වසර 06ක් ද, ඉන්පසු නියෝජ්‍ය වේත්‍රධාරි ධුරයේ වසර 12ක් ද, වේත්‍රධාරි ධුරයේ වසර පහමාරක් ද වශයෙන් වසර 23කට වැඩි කාලයක් ව්‍යවස්ථාදායකය වෙත සේවය කිරීමට ලැබීම මා ලද වරප්‍රසාදයක් මෙන්ම භාග්‍යයක් ලෙස ද සලකමි.

දශක 4කට වැඩි කාලයක් (වසර 42ක්) සේවය කර ඇති මා, දැනට පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨතම නිලධාරියා මෙන්ම පැරණි හා නව පාර්ලිමේන්තුවල සේවය කිරීමේ භාග්‍යය ලත් නිලධාරියකු වීම සිහිපත් කරන්නේ නිහතමානී ආඩම්බරයකිනි.

වේත්‍රධාරි ධුරයේ රාජකාරි ඉටු කිරීමේදී ගරු කථානායකතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු කැබිනට් අමාත්‍යවරුන් සහ ගරු සභාවේ පක්ෂ සහ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් විසින් මා වෙත ලබා දුන් සහයෝගය, සුහදශීලීත්වය හා කාරුණිකභාවය පිළිබඳව මාගේ හදපිරි ගෞරවය හා ප්‍රණාමය පිරිනැමීම සඳහා මෙය අවස්ථාව කර ගැනීමට කැමැත්තෙමි.

තවද, මෙම ගරු සභාව නියෝජනය කළ හිටපු සියලුම ගරු අග්‍රාමාත්‍යවරුන්, ගරු කථානායකවරුන්, පක්ෂ විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ද මාගේ කෘතඥතාව පිරිනැමීමට කැමැත්තෙමි. මීට අමතරව, හිටපු ගරු ජනාධිපතිවරුන් සහ වර්තමාන ගරු ජනාධිපතිතුමා වෙත ද මාගේ ගෞරවය සහ ප්‍රණාමය පුද කර සිටිමි.

අවසාන වශයෙන් පාර්ලිමේන්තුවේ වර්තමාන මහ ලේකම්තුමිය ඇතුළු සමස්ත පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය, අනුබද්ධිත හා අනෙකුත් කාර්ය මණ්ඩලය සහ සියලුම හිටපු පාර්ලිමේන්තු මහ ලේකම්වරුන් ඇතුළුව හිටපු කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් වෙත ද මාගේ හෘදයාංගම ස්තුතිය පළ කිරීමට කැමැත්තෙමි.

මෙම උත්තරීතර ආයතනය වෙත දශක 4කට වැඩි කාලයක් වගකීමෙන් යුතු සේවයක් ඉටු කිරීමටත්, පාර්ලිමේන්තු ක්‍රමවේදයේ වැදගත් තනතුරක් වන වේත්‍රධාරි ධුරය හෙබැවීමටත් මා හට අවස්ථාව ලැබීම, මා ලද වරප්‍රසාදයක් මෙන්ම ගෞරවයක් ලෙසත් සලකමි.

මවිසින්, වේත්‍රධාරි ධුරය හෙබැවූ කාලවකවානුව තුළ ඉතා සංකීර්ණ හා සංවේදී කාලවකවානුවක් වූ අතර, එහිදී මුහුණ දුන් අභියෝගයන් හා සංවේදී සිදුවීම් ඉදිරියේ නොබියව, සෘජුව කටයුතු කරමින් එම තත්ත්වයන් සමනය කර ගැනීමට කටයුතු කළ ආකාරය පිළිබඳ මතකය සදා ස්මරණීය බවද ඔබතුමිය වෙත ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

**මෙයට විශ්වාසී,**
**නරේන්ද්‍ර ප්‍රනාන්දු**
**වේත්‍රධාරි"**

**17. සේවය අගැයීමේ යෝජනාව - වේත්‍රධාරී :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 1981 වර්ෂයේ පාර්ලිමේන්තුවේ පරිපාලන දෙපාර්තමේන්තුවේ සේවයට බැඳී, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ධුරය දක්වා උසස්වීම් ලැබ, අනතුරුව මෙම පාර්ලිමේන්තුවේ සහකාර වේත්‍රධාරී ධුරයේ වසර 6ක් ද, නියෝජ්‍ය වේත්‍රධාරී ධුරයේ වසර 12ක් ද, වේත්‍රධාරී ධුරයේ වසර පහමාරක් ද වශයෙන් මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ සේවා කාලය වසර 42ක් සම්පූර්ණ කර, 2024 ජනවාරි 30 වැනි දින විශ්‍රාම ගනු ලබන නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට කරන ලද විශිෂ්ට සේවාව මෙම ගරු සභාව අගය කරන අතර, ඔහු විශ්‍රාම යන අවස්ථාවේ මෙම පාර්ලිමේන්තුව ඔහුට ශුභාශිංසනය කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, ඒකච්ඡන්දයෙන් සම්මත විය.

එකල්හි වේලාව අ.භා. 6.00 පසු කර තිබුයෙන් අ.භා. 7.41 ට කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා, අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2024 පෙබරවාරි 06 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.